[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 10 ශ්‍රේණිය | විෂයය - පුරවැසි අධ්‍යාපනය | පත්‍රය I | පැය 01 යි. |
|---|---|---|---|

නම ........................................................................

### I කොටස

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුරු තෝරන්න.**

01). ඇතන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනයක් වූයේ,
1). සෙනෙට් සභාව යි  2). මන්ත්‍රී සභාව යි
3). පුරවැසි සභාව යි  4). රාජ සභාවයි

02). ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වැදගත් වීමට හේතුවක් වන්නේ මින් කුමක් ද ?
1). ආණ්ඩු බලය හිමිවන්නේ ජනාධිපති තීරණය අනුව ය.
2). නීති සම්පාදනය කරනු ලබන්නේ විධායකයේ තනි කැමැත්ත මතය
3). පාලනය සඳහා නියෝජිතයන් තෝරා ගනු ලබනුයේ නීති උපදෙස් අනුවය
4). පාලනය සඳහා නියෝජිතයන් පත් කරගනු ලබන්නේ මහජනතාවගේ බහුතර කැමැත්ත අනුවය.

03). ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ජනතාව සතු බලය හැඳින්වෙන්නේ,
1). නීත්‍යානුකූල බලය යනුවෙනි
2). සර්ව ජන ඡන්ද බලය යනුවෙනි
3). පරමාධිපත්‍ය බලය යනුවෙනි
4). නීතියේ ආධිපත්‍ය බලය යනුවෙනි.

04). ඒක පක්ෂ ක්‍රමයක් පවතින රටකට නිදසුනක් වන්නේ මින් කුමක්ද?
1). ඉන්දියාව  2). උතුරු ඇමෙරිකාව
3). ශ්‍රී ලංකාව  4). උතුරු කොරියාව

05). ශ්‍රී ලංකාවේ ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා භාවිතා කරන ප්‍රධාන නිර්ණායක සඳහන් පිළිතුර තෝරන්න.
1). මැතිවරණ කොට්ඨාස හා ග්‍රාම නිලධාරී වසම
2). භූමිය හා රටේ පිහිටීම
3). රටේ ජනගහනය හා විධායකය
4). භූමිය හා ජනගහනය

06). නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණයකි.
1). ඡන්ද අපේක්ෂයන් සඳහා සුදුසුකම් අත්‍යවශ්‍ය නොවීම
2). වසරේ ඕනෑම කාලසීමාවක මැතිවරණ පැවැත්වීම
3). දේශපාලන බලය මත මැතිවරණ සඳහා ඉදිරිපත් වීම
4). සාමකාමී වාතාවරණයක් තුළ මැතිවරණ පැවැත්වීම

07). මිනිසාට තම සමාජ ජීවිතය පරිපූර්ණ කර ගැනීම සඳහා සමාජයෙන් ලැබෙන හිමිකම්,
1). නිදහසයි
2). යුතුකම් ය
3). අයිතිවාසිකම් ය
4). සමානාත්මතාවය යි

08). පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක ප්‍රධාන කොටස් තුන අනුපිළිවෙළින්,
1). අධිකරණය,විධායකය හා ව්‍යවස්ථාදායකයයි
2). අධිකරණය, ව්‍යවස්ථාදායකය හා විධායකයයි
3). ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණයයි
4). විධායකය, අධිකරණය හා ව්‍යවස්ථාදායකයයි

09). කිසිඳු වෙනස්කමකට භාජනය නොකොට අයිතිවාසිකම් හා නිදහස භුක්ති විඳීමට ඉඩ සැලසීම හඳුන්වන්නේ කවර නමකින්ද?
1). නීතිය
2). සදාචාරය
3).යුක්තිය
4). සමානාත්මතාවය

10). ප්‍රජාතන්ත්‍රවාදී පාලන රටාවක් ඇති කිරීමට බලපාන වැදගත් සාධකයක් වන්නේ,
1). රාජ්‍ය සේවකයන්ට වැඩි බලතල ලබා දීමය
2). නිදහස් ජන මාධ්‍යයක් පවත්වා ගෙන යාමය
3). ආණ්ඩු පක්ෂයේ සියලුම කාර්යයන් විවේචනය කිරීමය
4). රාජ්‍ය නොවන සංවිධාන දිරිමත් කිරීමය

11). රටක යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය ඉටු කරනු ලබන්නේ,
1). ජනතාව විසිනි
2). විධායක ජනපති විසිනි
3). පාර්ලිමේන්තුව මඟිනි
4). අධිකරණය මඟිනි

12). නීතියේ ආධිපත්‍ය පවතින බවට විදහාපාන ලක්ෂණයක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1). පවත්නා නීතිය යටතේ වරදකරුවන් දඬුවම් නොපැමිණවීම
2). නීතියේ රැකවරණය සියල්ලන්ටම සර්ව සාධාරණව නොලැබීම
3). පුද්ගලයකු අත්අඩංගුවට ගැනීමට චෝදනා පත්‍රයක් අවශ්‍ය නොමැති වීම
4). නීතිය ඉදිරියේ සමානාත්මතාවය

13). පහත සඳහන් ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1). රාජ්‍යය ස්ථාවර ආයතනයක් නොවේ.
2). ආණ්ඩුව ස්ථාවර ආයතනයකි.
3). රාජ්‍යය හා ආණ්ඩුව යන දෙකම ස්ථාවර ආයතන වේ.
4). ආණ්ඩුව වෙනස්වීම් වලට භාජනය වන ආයතනයකි.

14). ජාතික රාජ්‍යයක ලක්ෂණයක් වන්නේ,
1). පාර්ලිමේන්තුව යි
2). විධායකය යි.
3).ආණ්ඩුව යි.
4).අධිකරණය යි.

15). යුරෝපයේ බිහිවූ ප්‍රථම ජාතික රාජ්‍ය දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.

1).එංගලන්තය හා ජර්මනිය 2).ජර්මනිය හා ඉතාලිය

3).එංගලන්තය හා ප්‍රංශය 4).ඕලන්දය හා පෘතුගාලය

16). රාජ්‍යයේ කැමැත්ත හා මහජන අපේක්ෂා ක්‍රියාවට නංවන නියෝජිතයා ලෙස සැලකෙන්නේ,

1). අග්‍රාමාත්‍යවරයා යි. 2). ජනාධිපතිවරයායි.

3). ආණ්ඩුවයි 4). කථානායකවරයා යි.

17).පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකය වන්නේ,

1). අගමැතිවරයා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයයි.

2). ජනාධිපතිවරයා ඇතුළු කැබිනට් මණ්ඩලයයි.

3). ජනාධිපතිවරයා හා අග්‍රාමාත්‍යවරයා යි.

4). කථානායකවරයා ඇතුළු ආණ්ඩු පක්ෂයයි.

18). පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ලක්ෂණයක් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1). විධායකය,ව්‍යවස්ථාදායකයට වගකීමට සෘජුවම බැඳී නැත.

2). ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සෘජු සබඳතාවයක් නොපවතී.

3). විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව තිබේ.

4). විධායක බලය හසුරවන්නේ ජනාධිපති විසිනි.

19). "බාහිර බාධකයන් ගෙන් තොරව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාව නිදහසයි" යනුවෙන් ප්‍රකාශ කරනු ලැබුවේ,

1). ඇරිස්ටෝටල් ය. 2). මහාචාර්ය ගානර් ය.

3). ජී.ඩී.එච්.කෝල් ය. 4). අයිවර් ජෙනිංග්ස් ය.

20).

- නීති සම්මත කිරීම.
- මුදල් පාලනය.

මෙම කාර්යයන් සිදුකරනු ලබන්නේ,

1). අධිකරණය මඟිනි. 2). ව්‍යවස්ථාදායකය මඟිනි.

3). විධායකය මගිනි. 4). ඉහත සියලු ආයතන මගිනි

21). ජනාධිපති ආණ්ඩු ක්‍රමයක ජනාධිපතිවරයා තෝරා ගනු ලබන්නේ,

1). අගමැති විසිනි. 2). මහමැතිවරණයකිනි.

3). පාර්ලිමේන්තුව මගිනි. 4). ජනාධිපතිවරණයක් මගිනි.

**අංක 22 ,23 ප්‍රශ්න සඳහා පහත තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.**

A. පවතින නීතියට ගරු කිරීම.

B. සමාජ සිරිත් විරිත් පිළිපැදීම.

C. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම.

D. වැඩිහිටියන්ට ගරු කිරීම.

22). පුරවැසියකු සතු නීතිමය යුතුකම් පමණක් දැක්වෙන පිළිතුරු අයත් වරණය තෝරන්න.

1). A D 2). AB 3). AC 4). CD

23). සදාචාරාත්මක  යුතුකම් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1). BA 2). BC 3). CD 4). BD

24). පුරවැසියන්ගේ බාහිර චර්යාව පාලනය සඳහා රාජ්‍ය මගින් පනවනු ලබන රීති සමුදාය හැඳින්වෙන්නේ,

1).රාජ්‍ය බලය යනුවෙනි. 2).රීති පද්ධතිය නමිනි.
3).නීතිය නමිනි. 4).ස්වාධීනත්වය නමිනි.

25). අයිතිවාසිකම් හා බැඳුණු  සදාචාරාත්මක  යුතුකම් සඳහන් වන පිළිතුර තෝරන්න.

1). පොදු දේපළ ආරක්ෂා කිරීම 2). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම.
3). පරිසරය ආරක්ෂා කිරීම. 4). රජය විසින් පනවන බදු ගෙවීම.

26). මැතිවරණයකදී මහ ජනතාවට හිතකර ආණ්ඩුවක් බලයට පත්  කර ගැනීමේ දී වැදගත්ම කාර්යභාරය පැවරෙන්නේ කා හටද?

1). ජනාධිපතිවරයාටය 2). ඡන්ද අපේක්ෂකයාට ය.
3). පාර්ලිමේන්තු මන්ත්‍රී වරයාට ය. 4). ඡන්ද දායකයාට ය.

27). ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක බලයෙහි අවසාන හිමිකරුවා වන්නේ කවුරුන්ද?

1).ආණ්ඩුව යි. 2).ජනතාව යි.
3).අග්‍රමාත්‍යවරයා ය. 4).විධායකයේ ප්‍රධානියා ය.

28). ඇමෙරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම  ව්‍යවස්ථාව අනුව මධ්‍යම රජයට බලතල අයත්වන විෂයන් දෙකක් වන්නේ,

1).බදු පැනවීම හා විදේශ වෙළඳාම ය. 2).නිවාස හා ඉදිකිරීම් ය.
3).අධ්‍යාපනය හා සෞඛ්‍යය ය. 4).පළාත් පාලනය හා මහා මාර්ග ය.

29). පළාත් සභා ක්‍රමය යටතේ මධ්‍යම රජය හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කරන නියෝජිතයා වන්නේ,

1).පළාත් සභා සභාපති වරයාය. 2).පළාත් ආණ්ඩුකාරවරයා ය
3).පළාත් ප්‍රධාන ලේකම්වරයා ය. 4).මහ ඇමතිවරයාය.

30). මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම යනු,

1).බලය විමධ්‍යගත කිරීම යි. 2).බලතල බෙදීමයි.
3).බලය නියාමනය කිරීමයි. 4).බලය ඒකරාශී කිරීමයි.

31). සන්ධීය රාජ්‍යයක බලය බෙදාහැරීම සිදු වන්නේ,

1).මධ්‍යම ආණ්ඩුව හා ජනාධිපති අතරය.
2).ප්‍රාන්ත ආණ්ඩු හා ජනාධිපති අතරය.
3).ප්‍රාන්ත ආණ්ඩුකරු හා මධ්‍යම ආණ්ඩුව අතරය.
4).මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතරය.

32). ස්විට්සර්ලන්තයේ  ක්‍රියාත්මක වන  ප්‍රාදේශීය ආණ්ඩු හඳුන්වන සුවිශේෂී නාමය කුමක්ද?

1).මහා මණ්ඩල 2).ප්‍රාන්ත
3).කැන්ටන් 4).මණ්ඩල

33). බටහිර රටවල් ප්‍රබල ජාතික රාජ්‍යය ලෙස නැගී සිටීමට හේතු වූ ප්‍රධාන සාධකයකි.

1). සමාජ සුභසාධනය ඇති කිරීම. 2). ජාතික ඒකාග්‍රතාවය.

3). නොදියුණු ආර්ථික තත්ත්වය. 4). වැඩවසම් ක්‍රමය පවත්වාගෙන යාම.

34). එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යුහය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1).ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා මධ්‍යම ආණ්ඩුවේ බලය පමණක් ප්‍රමාණවත්ය.

2).ජනාධිපතිවරයා විසින් සමහර බලතල ක්‍රියාත්මක කිරීමේදී විධායකයේ පමණක් අනුමැතිය ලබා ගනී.

3).මධ්‍යම හා ප්‍රාන්ත ආණ්ඩු අතර ගැටලුකාරී තත්ත්වයක් මතු වුවහොත් එය විසඳනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි.

4).ෆෙඩරල් අධිකරණ පද්ධතියක් ක්‍රියාත්මක වේ.

35). සංස්කෘතිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1). සමාජයේ පැවැත්ම සඳහා සංස්කෘතිය බල නොපායි.

2). කාලයත් සමග සංස්කෘතිය වෙනස් නොවේ.

3). සිතුම් පැතුම් සංස්කෘතියට අයත් නොවේ.

4). පුද්ගලයා ජීවත්වන සමාජය අනුව සංස්කෘතිය ද වෙනස් වේ.

36). බහු සංස්කෘතික භාවය සම්බන්ධයෙන් "වෙනස්කම් තුළින් එකමුතු බව" යන්න තේමාව කරගත් රටක් වනුයේ,

1). ඇමෙරිකාව ය 2). බ්‍රිතාන්‍යය ය

3). ඉන්දියාව ය 4). සිංගප්පූරුව ය

37). බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන්,

1). මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය බිඳ වැටේ.

2). ගැටුම් වර්ධනය වේ.

3). අන්‍ය සංස්කෘතීන්ට අහරු සිදුවේ.

4). එක් ජාතියක් එක් රටක් යන හැඟීම වර්ධනය වේ.

38). ශ්‍රී ලංකා ජනගහනයේ ආගම් අනුව 70.2% ක ප්‍රතිශතයක් ඇත්තේ කවර ආගමේද,

1). හින්දු 2). ඉස්ලාම්

3). බෞද්ධ 4). ක්‍රිස්තියානි

39). සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන හේතුවක් වන්නේ,

1). අල්ලස් හා දූෂණ යෙන් තොර වීම.

2). රාජ්‍ය පාලකයන් වගකීමෙන් කටයුතු කිරීම.

3). රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම.

4). පෞද්ගලික අංශය ජාතික අභිලාෂ තකා කටයුතු කිරීම.

40). පුරවැසි යුතුකම් සම්බන්ධයෙන් වඩාත් **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

1). පොදු දේපල අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීම.

2). රැකියාවෙහි යෙදීමේ දී හෘද සාක්ෂියට එකඟව වැඩ කිරීම අනවශ්‍ය වීම.

3). සමානාත්මතා මූලධර්මය ආරක්ෂා කිරීම අත්‍යවශ්‍ය නොවීම.

4). පොදු දේපළ සුරක්ෂිත කොට ආරක්ෂා කිරීම

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය

**දෙවන වාර ඇගයීම - 2023**

| 10 ශ්‍රේණිය | විෂයය - පුරවැසි අධ්‍යාපනය | පත්‍රය II | පැය 02 යි. |
|---|---|---|---|

නම ...........................................................................

**II කොටස**

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01).

I). ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ චින්තකයන් දෙදෙනකු නම් කරන්න.

II). බහු පක්ෂ ක්‍රමයක් පවතින රටවල් දෙකක් නම් කරන්න.

III). ඡන්ද දායකයකු සතු අයිතීන් දෙකක් නම් කරන්න.

IV). රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.

V). ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු සතු විය යුතු වැදගත් ගුණාංග දෙකක් සඳහන් කරන්න.

VI). මානව සංවර්ධනයට බලපාන සාධක 2ක් නම් කරන්න.

VII). ජාතික රාජ්‍යය බිහිවීමට බලපෑ හේතු 2ක් නම් කරන්න.

VIII). ඌව පළාතට අයත් දිස්ත්‍රික්ක 2ක් නම් කරන්න.

IX). ආණ්ඩුකාරවරයකු සතු බලතල හා කාර්යයන් දෙකක් නම් කරන්න.

X). පාසල් සිසුවකු වශයෙන් ඔබ සතු අයිතිවාසිකම් දෙකක් නම් කරන්න.

**(ලකුණු 2 × 10 = 20)**

02). ජනතාව විසින් ජනතාව උදෙසා ගෙන යනු ලබන ජනතාවගේ පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයයි.

I). පාලන ක්‍රමයක් ලෙස ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II). ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක අංග ලක්ෂණ තුනක් දක්වන්න. (ලකුණු 03)

III). ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්ම සඳහා නිදහස් මාධ්‍ය මඟින් ඉටුකළ යුතු කාර්යයන් තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

03). ප්‍රීතිමත් හා ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමේ අරමුණින් මිනිසුන් එකට එක් වී පිහිටුවා ගත් ආයතනය රාජ්‍යය නම් වේ.

I). රාජ්‍යය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ චින්තකයන් දෙදෙනකු නම් කරන්න. (ලකුණු 02)

II). ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ තුනක් නම් කරන්න. (ලකුණු 03)

III). රාජ්‍යයට පැවරෙන කාර්යයන් තුනක් නම් කර එක් කාර්යයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04). බලය විමධ්‍යගත කර ඇති ආණ්ඩු ඒකීය ආණ්ඩු ලෙස හැඳින්වේ.

I). ඒකීය ආණ්ඩු ක්‍රම පවතින රාජ්‍යයන්ට නිදසුන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II). ඒකීය ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

III). A - සන්ධීය ආණ්ඩු ක්‍රමයක් පවතින රටවල් දෙකක් නම් කරන්න.

B - සන්ධිය ආණ්ඩුක්‍රමයක දැකිය හැකි යහපත් ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

(ලකුණු 05)

05).

I). ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන අතුරින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II). පළාත් සභා සතු බලතල ලැයිස්තු තුනකින් වර්ගීකරණය කර ඇත. ඒවා නම් කරන්න. (ලකුණු 03)

III). පහත සඳහන් මාතෘකා වලින් එකක් පමණක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

1). පළාත් ආණ්ඩුකාරවරයා

2). පළාත් සභාවක ආයතනික ව්‍යුහය

3). මහ සභාව

(ලකුණු 05)

06). සෑම සමාජයකම සංස්කෘතිය මඟින් එම සමාජයේ පැවැත්ම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

I). සංස්කෘතිය පිළිබඳ අදහස් ඉදිරිපත් කළ චින්තකයන් දෙදෙනකු නම් කරන්න. (ලකුණු 02)

II). ලෝකය එකම විශ්ව ගම්මානයක් බවට පත්වී සංස්කෘතික සම්මිශ්‍රණය ඉතා වේගයෙන් සිදුවීමට බලපාන හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

III). ජන සමාජයේ දක්නට ලැබෙන සියලුම බලවේග මෙහෙයවන ලක්ෂණ සංස්කෘතියට අයත් වේ. මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 05)

07). ගෝලීයකරණය තුළ බහු සංස්කෘතික සමාජ බිහිවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ.

I). බහු සංස්කෘතික සමාජයක් බිහිවීමට බලපාන සාධක 2ක් නම් කරන්න. (ලකුණු 02)

II). බහු සංස්කෘතික සමාජයක පැවැත්ම සඳහා යහ පාලනයක් තුළ තිබිය යුතු ගුණාංග තුනක් නම් කරන්න. (ලකුණු 03)

III). බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියන් ලෙස අපට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

(ලකුණු 05)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න